කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2016/2017

## SOC 2228 – ශ්‍රී ලාංකේය සමාජය වටහා ගැනීම

පැය දෙක (02) යි

1 වැනි කොටසින් සහ 2 වැනි කොටසින් අවම වශයෙන් එක (01) ප්‍රශ්නයක් බැගින් තෝරා ගෙන ප්‍රශ්න තුන (03) කට පමණක් පිළිතුරු සපයන්න.

---

### 1 වැනි කොටස

1. පූර්ව යටත් විජිත ශ්‍රී ලාංකේය සමාජ සැකැස්ම තුළ හඳුනා ගත හැකි ප්‍රධාන සමාජ සංඝටක මොනවාද යන්න උදාහරණ සහිතව පැහැදිළි කරන්න.

2. 'යටත් විජිතවාදය විසින් ශ්‍රී ලාංකේය සමාජය ව්‍යුහාත්මක පරිවර්තනයකට ලක් කරන ලදී.' මෙම ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න.

3. පශ්චාත් යටත් විජිත ශ්‍රී ලාංකේය සමාජය අවබෝධ කරගැනීමෙහි ලා 1977 න් පසුව ඇති වූ නව ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ කොතරම් දුරට ඉවහල් වූයේ දැයි සාකච්ඡා කරන්න.

### 2 වැනි කොටස

**ප්‍රශ්න වලට පිළිතුරු දීමේ දි පාඨමාලාවේ මෙම කොටස සඳහා නිර්දේශිත සාහිත්‍යය ඇසුරෙන් පිළිතුරු දිය යුතු ය.**

4. ගණනාථ ඔබේසේකර සිංහල - බෞද්ධ අනන්‍යතාව සහ බෞද්ධ හෘද සාක්ෂිය පිළිබඳ කරන සාකච්ඡාව, දෙමළ හා මුස්ලිම් ජනවාර්ගික අනන්‍යතාව හා සම්බන්ධකොට විභාග කරන්න.

අ.පි.බ.

5. 'පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාවේ දේශපාලනය වටහා ගැනීමෙහි ලා සුළු ධනේශ්වර පංතියේ නැඟීම යන්න කේන්ද්‍රීය සාධකයකි.' සාකච්ඡා කරන්න.

6. 'ලංකාවේ විශ්ව විද්‍යාලවල උප සංස්කෘතියක් පවතින්නේය' යන අදහස, පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය වර්ධනය වීමේ ඉතිහාසය තුළ තබා, විචාරශීලිව සාකච්ඡා කරන්න.

******************